# රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

## SMIB හි වෘත්තීමය අවස්ථා

ජාතියේ නිවාස බැංකුව වශයෙන් ප්‍රමුඛතාවය උසුලන SMIB තම ගනුදෙනුකරුවන්ට විවිධ පහසුකම් සැළසීමට සහ ඔවුන්ගේ තෘප්තිය වෙනුවෙන් විවිධ සේවා සැපයීමේ අරමුණින් දැනට කටයුතු සම්පාදනය කරනු ලබයි. ඒ අනුව කටයුතු කිරීම සඳහා මනා ක්‍රියාශීලී නායකත්ව භූමිකාවක් නිරූපණය කිරීමේ හැකියාව ඇති, ව්‍යාපාර අරමුණු සපුරාගැනීම සඳහා පූර්ණ කැපවීම සහ දායකත්වය ලබාදිය හැකි අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද ඇති අපේක්ෂකයන්ගෙන්, පහත සඳහන් තනතුර සඳහා අයැදුම්පත් කැඳවනු ලැබේ.

## අනුකූලතා නිලධාරී - COMPLIANCE OFFICER

**ප්‍රධාන වගකීම්:**

මෙය බැංකුවේ ප්‍රධාන කළමනාකරණ තනතුරක් (ප්‍රධාන කළමනාකරු මට්ටමේ) වන අතර, එහි වගකීම් වනුයේ බැංකුවේ අනුකූලතා අවදානම හඳුනා ගැනීම සහ කළමනාකාරණය කිරීම සහ බැංකුවේ අනුකූලතා ප්‍රයත්නයන් අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ චක්‍රලේඛ, උපදෙස් සහ අභ්‍යන්තර ප්‍රමිතීන් පිළිපදිමින්, බැංකුව එහි බාහිර නියාමන අවශ්‍යතා සහ අභ්‍යන්තර ප්‍රතිපත්තිවලට අනුකූල වන බවට සහතික කිරීම සහ නියමිත කාලයේදී ඒ පිළිබඳව ඒකාබද්ධ අවධානම් කළමනාකරණ කමිටු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම.

**සුදුසුකම්:**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් බැංකුකරණය, ව්‍යාපාර, වාණිජ, ආර්ථික විද්‍යා, ගිණුම්කරණ, භෞතික විද්‍යා, නීති උපාධිය හෝ ශාස්ත්‍රපති උපාධිය හෝ නීතිඥයෙකු වීම.

**සමග**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) / එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරී වරලත් ආයතනයේ (CIMA-UK) / වරලත් සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (ACCA-UK ) ආයතනයේ අවම සුදුසුකම් හෝ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමයේ පූර්ණ සාමාජිකත්වය (AIB) හෝ පිළිගත් ආයතනයකින් ලබාගත් අදාළ වෙනත් වෘත්තීය සුදුසුකම්. (බැංකු නියාමන අනුකූලතා ක්ෂේත්‍රයේ වෙනත් ඕනෑම සුදුසකම් ඇත්නම් වඩාත් හොඳයි)

**සේවා පළපුරුද්ද:**

බැංකු හෝ මූල්‍ය ආයතනයක සමස්ත වසර 10 ක පළපුරුද්ද, ඉන් අවම වශයෙන් වසර 5 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද. අපේක්ෂකයාට අනුකූලතා කාර්යය, නියාමන අනුකූලතාවය පිළිබඳව හොඳ දැනුමක්, මුදල් විශුද්ධිකරණයට එරෙහි ක්‍රියාපටිපාටි, ආයතනික පාලනය සහ ආචාර ධර්ම පිළිබඳ පළපුරුද්දක් සහ සම්පූර්ණ දැනීමක් තිබිය යුතුය.

**වේතන:**

වැටුප් පරිමාව මසකට රුපියල් 211,260 - 5,490 x 12 - 277,140 සමග බැංකුව විසින් අනුමත කරන ලද දීමනා (ජීවන වියදම් දීමනාව, කුලී දීමනාව සහ 10% දීමනාව). මාසික දළ වැටුප රුපියල් 347,000.00 පමණ වෙයි.

**වයස:**

අවුරුදු 50 නොඉක්මවන (කෙසේ වෙතත් දැනටමත් රාජ්‍ය අංශයේ ආයතනයක සේවයේ නියුතු අය සඳහා මෙම වයස් සීමාව අදාළ නොවේ).

**පොදු කොන්දේසි:**

**තෝරාගැනීමේ ක්‍රමය** බැංකුවේ බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය හා ක්‍රියාපටිපාටියට අනුව සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**අයැදුම්පත් භාරගන්නා අවසාන දිනය 2024 සැප්තැම්බර් 23**

**අයදුම් කළ යුතු ආකාරය:**

උනන්දුවක් දක්වන සුදුසුකම් ලත් අපේක්ෂකයන් ඔවුන්ගේ ජීව දත්ත, සහ ඔවුන්ගේ අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්වල පිටපත් සහ ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක සමගින් පහත විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතුය.

ලැබෙන සෑම අයදුම්පතක්ම දැඩි රහස්‍ය භාවයකින් යුතුව සළකා බලනු ලබන අතර, කුමන අන්දමේ හෝ බලපෑමක් කරනු ලැබීම නුසුදුසුකමක් ලෙසින් සළකා ක්‍රියා කරනු ඇත. තෝරාගැනීමේ පදනම තීරණය කිරීම බඳවා ගැනීම, කල්දැමීම හෝ අවංලගු කිරීම හෝ බඳවා ගැනීම් පිළිබඳව නිර්ණායකයන් වෙනස් කිරීමේ සහ එවැනි ක්‍රියාවකට එළඹීමේ අයිතිය බැංකුව සතුය. අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වනු ඇත.

**අයදුම්පත් එවිය යුත්තේ careers@smib.lk හරහා පමණි.**

tamilguru.lk

# රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

## SMIB හි වෘත්තීමය අවස්ථා

ජාතියේ නිවාස බැංකුව ලෙස SMIB, ඉහළ මට්ටමේ පාරිභෝගික තෘප්තියක් සහ විවිධාකාර සේවාවන් පිරිනැමීම සඳහා බැංකුවේ ක්‍රියාකාරීත්වය ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කරමින් සිටී. එබැවින් අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද සහිත, ගතික නායකත්ව භූමිකාවක් නිරූපණය කළ සහ ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පූර්ණ කැපවීමක් කළ හැකි අපේක්ෂකයන්ගෙන්, පහත සඳහන් තනතුර සඳහා අයැදුම්පත් කැඳවනු ලැබේ.

## සහකාර කළමනාකරු දත්ත සමුදා පරිපාලනය
## (ASSISTANT MANAGER- DATABASE ADMINISTRATION)

**ප්‍රධාන වගකීම්:**

නිතිපතා උපස්ථ වාර්තා තබාගැනීම, නවතම පැච් (Patch) යෙදීම, කාර්ය සාධනය අධීක්ෂණය සහ දෝෂ නිරාකරණය ඇතුළුව සියලුම දත්ත සමුදා සේවාදායකයන් සහ එහි සේවාවන් කළමනාකරණය කිරීමේ වගකීම දැරීම, සියලුම තීරණාත්මක දත්ත සමුදායන් කිසිදු බාධාවකින් තොරව ක්‍රියාත්මක වන බවට සහතික කළ යුතු අතර, බර සමතුලිතතාවය, HA (High Availability) සහ DR (Disaster Recovery) තාක්ෂණික ක්‍රම සමගින් ඉහළ මට්ටමින් ලබා ගැනීමේ හැකියාවක් තිබිය යුතුය. සියලුම දත්ත සමුදා සේවාදායකයන් සඳහා නියාමන, අනුකූලතා සහ ආරක්ෂක අවශ්‍යතා සම්පූර්ණ කිරීම අවශ්‍ය වේ.

**සුදුසුකම්:**

තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධිය.

දත්ත සමුදා කළමනාකරණය ආශ්‍රිත වෘත්තීය සහතික තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

**පළපුරුද්ද:**

සමස්ත වශයෙන් වසර 4 ක පළපුරුද්ද සමග දත්ත සමුදා පරිපාලනයේ අවම වශයෙන් වසර 2 ක බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ අත්දැකීම් තිබීම නම් වඩාත් සුදුසුය. PostgreSQL/Enterprise DB පළපුරුද්ද තිබීම වාසිදායක වේ.

**වේතන:**

වැටුප් පරිමාව මසකට රුපියල් 113,040 - 1880 x 20 - 150,640 සමග බැංකුව විසින් අනුමත කරන ලද දීමනා (ජීවන වියදම් දීමනාව, කුලී දීමනාව සහ 10% දීමනාව). මුළු මාසික දළ වැටුප රුපියල් 220,000 ක් පමණ වෙයි)

**වයස:**

අවුරුදු 45 නොඉක්මවන (කෙසේ වෙතත් දැනටමත් රාජ්‍ය අංශයේ ආයතනයක සේවයේ නියුතු අය සඳහා මෙම වයස් සීමාව අදාළ නොවේ).

**පොදු කොන්දේසි:**

**තෝරාගැනීමේ ක්‍රමය** බැංකුවේ බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය හා ක්‍රියාපටිපාටියට අනුව සම්මුඛ පරීක්ෂණයක් මගින්.

අයැදුම්පත් භාරගන්නා අවසාන දිනය **2024 සැප්තැම්බර් 23**

**අයදුම් කළ යුතු ආකාරය:**

උනන්දුවක් දක්වන සුදුසුකම් ලත් අපේක්ෂකයන් ඔවුන්ගේ ජීව දත්ත, සහ ඔවුන්ගේ අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්වල පිටපත් සහ ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක සමගින් පහත විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතුය.

ලැබෙන සෑම අයදුම්පතක්ම දැඩි රහස්‍ය භාවයකින් යුතුව සළකා බලනු ලබන අතර, කුමන අන්දමේ හෝ බලපෑමක් කරනු ලැබීම නුසුදුසුකමක් ලෙසින් සළකා ක්‍රියා කරනු ඇත. තෝරාගැනීමේ පදනම තීරණය කිරීම බඳවා ගැනීම, කල්දැමීම හෝ අවංලගු කිරීම හෝ බඳවා ගැනීම් පිළිබඳව නිර්ණායකයන් වෙනස් කිරීමේ සහ එවැනි ක්‍රියාවකට එළඹීමේ අයිතිය බැංකුව සතුය. අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වනු ඇත.

**අයදුම්පත් එවිය යුත්තේ careers@smib.lk හරහා පමණි.**